# මානසික දියුණුව උදෙසා ප්‍රතිසන්ධි චිත්තයේ උපයෝගීතාව

ඉගුරුවත්තේ ධම්මගවේෂි[1]

සමස්ථ සත්ත්වයාගේම ප්‍රතිසන්ධිය සිදු වනුයේ කර්මයට අනුරූපීවය. කර්මයට අනුරූපීව ඊට උපනිශ්‍රය වූ භවයක් තුළ ප්‍රතිසන්ධිය ලැබීම ජාති වශයෙන් හැඳින්වේ. ව්‍යවහාර ලෝකය තුළ උපත වශයෙන් සඳහන් කරණුයේ එම කාරණාවය. දෙවියන් මිනිසුන් බ්‍රහ්මයන් ආදී සත්ත්ව කොට්ඨාස උසස් ස්වභාවයෙහිලා සලකණුයේ ඔවුන් ලැබූ ප්‍රතිසන්ධිය උපනිශ්‍රය කොටගෙනය. තිරිසන් ආදී සත්ත්වයන් දුර්වල සත්ත්ව කොටසක් වශයෙන් හඳුන්වනුයේ ද ඔවුන් ලැබූ ප්‍රතිසන්ධියෙහි පවත්නා දුර්වල ස්වභාවය හේතු කොටගෙනය. එබැවින් සත්ත්වයකුගේ උසස් බව හා දුර්වල ස්වභාවය තීරණය වන ප්‍රධාන සාධකයකි ප්‍රතිසන්ධිය. බෞද්ධ දර්ශනය තුළ ප්‍රතිසන්ධිය පිළිබඳව ඉතා ගැඹුරින් මෙන්ම සියුම් ලෙස සාකච්ඡාවට බඳුන් කොට තිබෙනුයේ එහෙයිනි. මනස උසස් ආකාරයට දියුණු කිරීමට ප්‍රතිසන්ධිය ප්‍රබල දායකත්වයක් සපයයි. ප්‍රතිසන්ධිය වශයෙන් පහළ වනුයේ සිතකි. සෑම සිතකම එයට අනුරූපී වූ කෘත්‍යයක් (කාර්යයක්) පවතී. ප්‍රතිසන්ධිය යනු කෘත්‍යයකි. එහෙයින් ප්‍රතිසන්ධි කෘත්‍යය සිදු කරමින් පහළ වනුයේ සිතකි. මිනිස් භවයේ උපත ලැබුවන් තුළ විවිධත්වයක් දක්නට ලැබෙනුයේ එසේ පහළ වූ සිතෙහි පවත්නා විවිධාකාර වූ ස්වභාවයන්ට අනුරූපීව ය. ධර්මය විවරණය කිරීමේ දී එකම දේශනය එක් අයකුට ලෝක ස්වභාවය තත්ත්වාකාරයෙන් අවබෝධ කිරීම පිණිසත් තව කෙනෙකුට කිසිඳු විශේෂත්වයක් ඇති නොවීමට හේතුව වනුයේ ද ඔහු ලැබූ ප්‍රතිසන්ධියයි. ධර්මය තුළ ප්‍රතිසන්ධිය විවිධාකාරයෙන් විමසුමට බඳුන් කරයි. ත්‍රි හේතුක ප්‍රතිසන්ධිය, ද්විහේතුක ප්‍රතිසන්ධිය, අහේතුක ප්‍රතිසන්ධි වශයෙනි. මෙලෙස ප්‍රතිසන්ධිය විවිධාකාරයෙන් දක්නට ලැබෙනුයේ පවත්නා සිතෙහි ස්වභාවයට අනුරූපීවය. සිත වෙනස් ආකාරයට ලක් වනුයේ කර්මය සිදු කරන අවස්ථාවේ සහ ඊට පසුව සිත පැවැත්වූ ආකාරයට අනුරූපීවය.

මනස දියුණු තත්ත්වයට පත් කිරීමට හැකි වනුයේ ත්‍රි හේතුක ප්‍රතිසන්ධියක් ලැබූවකුට පමණි. ධර්මය තුළ ඔහු හඳුන්වනුයේ ජාති ප්‍රාඥයා වශයෙනි. එනම් උපතින්ම පාරිශුද්ධ වූ භවාංග සිතක් ඇති තැනැත්තාය. ධර්මය තුළ පවත්නා සියුම් ස්වභාවයන් තේරුම් ගෙන සිත මනාව දියුණු කරලීමට හැකිවනුයේ ඔහුට පමණි. ධ්‍යාන උපදවා ගැනීම දක්වා ද සිත දියුණු කිරීමට හැකි වනුයේ ත්‍රි හේතුක ප්‍රතිසන්ධිකයාට ය. ඒ පිළිබඳ ඉතා සියුම් වූ විග්‍රහයන් ධර්මය තුළ දක්නට ලබේ. උපතින්ම ජාති ප්‍රඥාව නොලැබූ තැනැත්තන් සමත් වන්නේ ධර්මය තුළ පවත්නා ධර්මතාවයන් කටපාඩම් කොටගෙන ඒවායේ ගණන් කීමට පමණි. ඔවුනට උසස් මානසික දියුණුවක් ලැබිය නොහැකිය. එහි පවත්නා සියුම් ස්වභාවය ආකාර බොහෝ ගණනකින් දක්වා ඇත. ආසය, අනුසය, චරිත, අධිමුක්ති ආදිය ඉන් කිහිපයකි. මේ සියල්ල විග්‍රහයට ලක් වනුයේ ප්‍රතිසන්ධිය උපනිශ්‍රය කොටගෙනය. පූර්ව පූර්ව ධර්මතා රාශියක් සෑම විටම මේ සෑම කාරණයක් සමගම බද්ධව පවතී. එහි පවත්නා ඉතා සියුම් ස්වාභාවයන් අධ්‍යයනය කිරීම තුළ මනසේ පවත්නා ගැඹුරු ස්වභාවය සහ සියුම් ස්වභාවය කවරේද යන්න ප්‍රතිසන්ධි චිත්තය උපයෝගී කොටගෙන වටහාගැනීමට හැකියාව සැලසේ.

**ප්‍රමුඛ පද :** සත්ත්වයා, ප්‍රතිසන්ධිය, මනස, කෘත්‍යය, ජාති ප්‍රාඥයා

1 බෞද්ධ දර්ශනය විශේෂවේදී, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
dgaweshi@gmail.com